# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1989/37- 2016 ඔක්තෝබර් මස 19 වැනි බදාදා - 2016.10.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : බිය/03/1/1/256.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අධිකාරි පත්තුව සුළු කොට්ඨාසයේ ඉහල බියන්විල ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අවසාන භූ ලක්ෂණාත්මක පිඹුරු අංක ගම් 3697 හා 2016 අප්‍රේල් මස 07 වැනි දිනැති පිඹුරේ පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0014ක් පමණ වන පහත සඳහන් ඉඩම් කැබැල්ල.

**කැබලි අංක 132**

ඉඩමේ නම: ජම්බුගහවත්ත; විස්තරය: ශ්‍රමදාන මාවත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කේ. මාලනී කටුලන්ද, අංක 145/A, නුවර පාර, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0014

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 ඔක්තෝබර් මස 27 වැනි දින පෙ.ව. 10.00 ට බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 ඔක්තෝබර් මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ඩබ්.එච්. වී. පුෂ්පමාලා,
ප්‍රාදේශීය ලේකම්,
බියගම.

2016 ඔක්තෝබර් මස 17 වැනි දින,
බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11 - 165


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 24403 - 34 (2016/10)

ශුද්ධි පත්‍රයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : WGSWD&EIP/ACQ/KB/21.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/10/2013/LRB/155.

අංක 1968/14 හා 2016/05/25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* III වැනි කොටසේ 7 වැනි වගන්තිය *ගැසට් පත්‍රයට* අංක 9585 මූලික පිඹුරේ කැබලි අංක 16 දරණ ඉඩම් කොටස නොපෙනී යාමෙන් සිදුවී ඇති ප්‍රමාද දෝෂය හේතුවෙන් ඇතුළත් වී නොමැත. එබැවින් පහත විස්තර කරන ඉඩම් කොටස එයට ඇතුළත් විය යුතුයි.

**කැබලි අංකය 16**

ඉඩමේ නම: බක්මීගහ කුඹුර; විස්තරය: වැව; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: දයා ගමගේ මයා, අංක 362, කැස්බෑව පාර, බොරලැස්ගමුව; ප්‍රමාණය: හෙක්. 0.4161

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 නොවැම්බර් මස 30 වැනි දින පෙ.ව. 10.00 ට රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 03 දරන ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ඉඩම් අත්කර ගැනීමේ කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 නොවැම්බර් මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත්, එකී ඉඩම/ඉඩම් පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

සී. ඩබ්. අබේසූරිය,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී
වේරස් ගඟ වැසි ජලය අපවහන හා
පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2016 ඔක්තෝබර් මස 19 වැනි දින,
වේරස් ගඟ වැසි ජල අපවහන හා
පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

11-166

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.